# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2025 පෙබරවාරි මස 21 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2025.02.21 දින නිකුත් කරන ලදී)**

**දේශීය ආදායම් (සංශෝධන)**

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 30.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය:* මේ වගන්තිය මගින් (මෙහි මින්මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 150 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, බදු ගෙවන්නා විසින් ආපසු ගෙවීමක් ඉල්ලා සිටිනු ලැබිය හැකි කාලසීමාව වසර හතරක සිට වසර දෙක හමාරක් දක්වා අඩු කිරීම වේ.

*3 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ උපලේඛනයේ නීතියේ බලපෑම වනුයේ පුද්ගල ආදායම් බද්ද සඳහා අදාළ වන බදු නිදහස් සීමාව වැඩි කිරීම සහ පුද්ගලයන් සහ සමාගම් විසින් උපයනු ලබන ඇතැම් ලැබීම් සහ ලාභ සඳහා වූ බදු අනුප්‍රමාණ ප්‍රතිශෝධනය කිරීම වේ.

*4 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ උපලේඛනයේ නීතියේ බලපෑම වනුයේ ඇතැම් සේවා සැපයීම තුළින් උපයනු ලබන ලැබීම් සහ ලාභ, 2025 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි ඒ උපලේඛනය යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම්වලින් බැහැර කිරීම වේ.

*5 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර එය 3 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

එල්.ඩී.- ඕ 82/2024

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. (1) මේ පනත 2025 අංක   දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන 2025 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2017 අංක 24 දරන පනතේ 150 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 150 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2අ) වන උපවගන්තියේ (අ) ඡේදයේ -

(අ) "රුපියල් ලක්ෂයක් නොඉක්මවන්නේ නම්," යන වචන වෙනුවට, "2025 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හැටදහසක් නොඉක්මවන්නේ නම් හෝ 2025 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක් ලක්ෂ අසූදහසක් නොඉක්මවන්නේ නම්," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ ඡේදයේ අතුරු විධානයේ "හිමිකම් පෑම ජූනි මස තිස්වන දිනයෙන්, සැප්තැම්බර් මස තිස්වන දිනයෙන්, දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙන් සහ මාර්තු මස තිස් එක්

වන දිනයෙන් අවසන් වන යම් කාර්තුවක් සඳහා රුපියල් විසි පන්දහස නොඉක්මවන්නේ නම්,” යන වචන වෙනුවට, “හිමිකම් පෑම 2025 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හැට දහසක් හෝ ජූනි මස තිස්වන දිනයෙන්, සැප්තැම්බර් මස තිස්වන දිනයෙන්, දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙන් සහ මාර්තු මස තිස් එක් වන දිනයෙන් අවසන් වන යම් කාර්තුවක් සඳහා රුපියල් පහළොස් දහසක් නොඉක්මවන්නේ නම්, හෝ 2025 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක් ලක්ෂ අසූදහසක් හෝ ඒ යම් කාර්තුවක් සඳහා රුපියල් හතළිස් පන්දහසක් නොඉක්මවන්නේ නම්,” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ “බදු ගෙවන්නා” යන වචන වෙනුවට, “2024 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව, බදු ගෙවන්නා” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

“(4) 2024 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්-

(අ) මේ පනත යටතේ බදු වාර්තාවක් ගොනු කිරීමට බදු ගෙවන්නාට නියම කරනු

ලැබ ඇති අවස්ථාවක දී, අදාළ තක්සේරු වර්ෂයේ අවසාන දිනයේ සිට මාස තිහක් ඇතුළත; හෝ

(ආ) කොමසාරිස් ජනරාල්වරයාගේ මුල පිරීමෙන් ඒ ආපසු ගෙවීම හෝ බදු බැර කිරීම සිදු කරන අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරන ලද කාලසීමාව ඇතුළත,

ආපසු ගෙවීමක් හෝ බැර කිරීමක් සඳහා බදු ගෙවන්නා අයදුම් කරන්නේ නම් පමණක් මේ වගන්තිය යටතේ ඒ ආපසු ගෙවීම හෝ බැර කිරීම සිදු කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ -

(අ) ඒ ඡේදයේ (1ඇ) වන උපඡේදයේ "2023, අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "2023 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන, එහෙත්, 2025 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (1ඇ) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(1ඈ) (2) වන උපඡේදයේ විධිවිධානවලට යටත්ව, 2025 අප්‍රේල් මස 1 වන දිනයෙන්

ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා වාසික හෝ නිර්වාසික පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායම මත පහත දැක්වෙන අනුප්‍රමාණයන් අනුව බදු පැනවිය යුතු ය:-

| බදු අය කළ හැකි ආදායම | ගෙවිය යුතු බද්ද |
|---|---|
| රු. 1,000,000 නොඉක්මවන | රු. 0 ට අතිරික්ත මුදලින් 6% |
| රු. 1,000,000 ඉක්මවන නමුත් රු. 1,500,000 නො ඉක්මවන | රු. 60,000 ක් වූ මුදලක් සහ රු. 1,000,000 ට අතිරික්ත මුදලින් 18% |
| රු. 1,500,000 ඉක්මවන නමුත් රු. 2,000,000 නො ඉක්මවන | රු. 150,000 ක් වූ මුදලක් සහ රු. 1,500,000 ට අතිරික්ත මුදලින් 24% |
| රු. 2,000,000 ඉක්මවන නමුත් රු. 2,500,000 නො ඉක්මවන | රු. 270,000 ක් වූ මුදලක් සහ රු. 2,000,000 ට අතිරික්ත මුදලින් 30% |
| රු. 2,500,000 ඉක්මවන | රු. 420,000 ක් වූ මුදලක් සහ රු. 2,500,000 ට අතිරික්ත මුදලින් 36% |

(ඇ) ඒ ඡේදයේ (2) වන උපඡේදයේ (ඇ) අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(ඇ) (4) වන උපඡේදයේ සඳහන් ව්‍යාපාර ආදායම් වර්ගය මත -

(i) 2025 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව, 40% ක; සහ

(ii) 2025 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, 45% ක,

අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය; සහ";

(ඈ) ඒ ඡේදයේ (5) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය එකතු කිරීමෙන්:-

"(6) (1ඈ) වන උපඡේදයේ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, 2025 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, යම් පුද්ගලයකුගේ පහත දැක්වෙන ලැබීම් සහ ලාභ මත, 15% ක උපරිම අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය:-

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත දී ප්‍රයෝජනයට ගැනීම පිණිස ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී යම් තැනැත්තකු වෙත සපයනු ලබන සේවා සඳහා වන ගෙවීම, විදේශීය ව්‍යවහාර මුදලින් ලැබෙන අවස්ථාවක දී සහ බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවක දී, ඒ සේවා සැපයීමෙන් ලැබුණු හෝ උපයන ලද ලැබීම් සහ ලාභ;

(ආ) යම් විදේශීය මූලාශ්‍රයකින් ලැබෙන හෝ උපයනු ලබන ලැබීම් සහ ලාභ විදේශීය ව්‍යවහාර මුදලින් ලැබෙන හෝ උපයනු ලබන අවස්ථාවක දී සහ බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවක දී ඒ විදේශීය මූලාශ්‍රයෙන් ලැබුණු හෝ උපයන ලද ලැබීම් සහ ලාභ.";

(2) ඒ උපලේඛනයේ 4 වන ඡේදයේ -

(අ) ඒ ඡේදයේ (1) වන උපඡේදයේ "(2) වන, (2අ) වන, (2ආ) වන සහ (3) වන උපඡේදවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "(2) වන, (2අ) වන, (2ආ) වන, (2ඇ) වන සහ (3) වන උපඡේදවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (2ආ) වන උපඡේදයේ "2023 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "2023 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන එහෙත් 2025 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ ඡේදයේ (2ආ) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය එකතු කිරීමෙන්:-

"(2ඇ) 2025 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක බදු අය කළ හැකි ආදායමෙහි ඇතුළත් වන පහත දැක්වෙන ඒ ලැබීම් සහ ලාභ කොටස මත පහත දැක්වෙන අනුප්‍රමාණවලට අනුව බදු පැනවිය යුතු ය:-

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත දී ප්‍රයෝජනයට ගැනීම පිණිස ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී යම් තැනැත්තකු වෙත සපයනු ලබන සේවා සඳහා වන ගෙවීම, විදේශීය ව්‍යවහාර මුදලින් ලැබෙන අවස්ථාවක දී සහ බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවක දී, ඒ සේවා සැපයීමෙන් ලැබුණු හෝ උපයන ලද ලැබීම් සහ ලාභ - 15%;

(ආ) යම් විදේශීය මූලාශ්‍රයකින් ලැබෙන හෝ උපයනු ලබන ලැබීම් සහ ලාභ විදේශීය ව්‍යවහාර මුදලින් ලැබෙන හෝ උපයනු ලබන අවස්ථාවක දී සහ බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවක දී ඒ

විදේශීය මූලාශ්‍රයෙන් ලැබුණු හෝ උපයන ලද ලැබීම් සහ ලාභ - 15%;

(ඇ) ඔට්ටු ඇල්ලීම් සහ සූදු ක්‍රීඩා පැවැත්වීමෙන් ලැබෙන ලැබීම් සහ ලාභ - 45%; සහ

(ඈ) යම් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයක් අපනයනය කිරීමෙන් හැර, යම් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයක් නිෂ්පාදනය කොට විකිණීමෙන් හෝ ආනයනය කොට විකිණීමෙන් ලැබෙන ලැබීම් සහ ලාභ - 45%.”; සහ

(3) ඒ උපලේඛනයේ 10 වන ඡේදයේ (1) වන උපඡේදයේ (ඇ) (ii) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

“(ii) ගෙවන ලද පොලිය හෝ වට්ටම සඳහා -

(අ) 2023 ජනවාරි මස 1 වන දින සිට එහෙත් 2025 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව බලාත්මක වන පරිදි -5%;

(ආ) 2025 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි - 10%;”.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ (ද) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම

(1) ඒ ඡේදයේ (iii) වන උපඡේදයේ “2020 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “2020 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2025 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව,” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ඡේදයේ (iv) වන උපඡේදයේ “2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “2020 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2025 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව,” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම

5. ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනයේ 2 වන ඡේදයේ (අ) උපඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපඡේදයේ (iii) වන අයිතමයේ “මාස තුන සඳහා රු. 300,000 ක්; සහ” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “මාස තුන සඳහා රු. 300,000 ක්;” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ උපඡේදයේ (iv) වන අයිතමයේ “2023 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන” සහ “වර්ෂය සඳහා රු. 1,200,000 ක්,” යන වචන සහ ඉලක්කම් වෙනුවට, පිළිවෙළින් “2023 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන, එහෙත් 2025 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ” සහ “වර්ෂය සඳහා රු. 1,200,000 ක්; සහ” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ උපඡේදයේ (iv) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

“(v) 2025 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු. 1,800,000 ක්,”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

6. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.